
# සාරාංශය

## විදේශීය සංස්ථා ව්‍යුහ ආවරණයෙන්

# සත්‍ය හිමිකරුවන් සැඟවීම

***Amazon Books:*** ***Overseas Corporate Structures, Which hide 'Real Owners' - Foreign Business Empire of a Sri Lankan Entrepreneur ?***




*විශාලත්වය - 8.25” X 11” - පිටු ගණන 570*

කර්තෘ විසින් ඉතා දක්ෂ ලෙස සහ සුපරික්ෂාකාරීව ගැඹුරුව සිදු කරනු ලැබූ තියුණු විමර්ශනයන්හි සවිස්තර තොරතුරු, ලේඛන සහ සාක්ෂි සමඟින්, තම රටවල පුද්ගලයින්ගේ මුදල් සහ විදේශ වත්කම්, සංකීර්ණ සංස්ථාපිත ව්‍යුහයන් මුවාවෙන්, ‘සත්‍ය හිමිකරුවන්’ වසන් කරමින්, වෙනත් විදේශ රටවල සැඟවීමේ හැකියාවට අවස්ථාව ඇති කර දුන් සමහර රටවල් මෙම ග්‍රන්ථයෙන් මනාසේ එළිදරව් වේ.

මෙම ග්‍රන්ථය සකස් කර ඇත්තේ, එවකට ශ්‍රී ලංකාවේ සුප්‍රසිද්ධව සිටි, මෙම ග්‍රන්ථයේ දක්වා ඇති පරිදි නැසීගිය උපාලි විජේවර්ධන නමැති ව්‍යවසායකයාගේ මෙරට ව්‍යාප්තව තිබූ ව්‍යාපාරික වත්කම් සහ විශේෂයෙන් නොයෙකුත් විදේශීය රටවල ව්‍යාප්තව ගොස් තිබූ ව්‍යාපාරික වස්තු මුල්කරගෙන, පුළුල් ලෙස විමර්ශනය කරමින්, එම විමර්ශනයන් මගින් ලබාගත් කරුණු සහ දත්ත සනාථ කර ගැනීමට, නැසීගිය උපාලි විජේවර්ධනගේ සිංගප්පුරුවේ සිටි විශ්වාසවන්ත නීතිඥවරයෙකුව සිටි එංගලන්තයේ බැරිස්ටර් පදවිය දැරූ ඉෂ්වර් නහප්පන් ගෙන්ද, එම කරුණු සහ දත්ත විමසා සනාථ කරගත් පසුවය.

උපාලි විජේවර්ධනගේ සහෝදරියන් දෙදෙනා වන එනම්, හෙලේනා අනෝජා දේවි විජේසුන්දර හා අනුලා කල්‍යාණි දේවි ආටිගල විසින් කොළඹ දිසා අධිකරණයේ තෙස්තමේන්තු නඩු අංක 31166 / ටී දරණ නඩුවට ගොනු කර තිබූ ඒකාබද්ධ-පෙත්සමේ 5 (ආ) ඡේදයේ උපාලි විජේවර්ධනගේ විදේශ

ව්‍යාපාරික අයිතීන් සහ / හෝ විදේශ වත්කම් සහ / හෝ විදේශීය ව්‍යාපාරික ගනුදෙනු කොපමණ වන්නේද යන්න අඩංගු වන පහත සඳහන් සම්ප්‍රකාශය අන්‍යොන්‍යව සිදු කර තිබුණි.

“ 5 ආ) පහත සමාගම් ඇතුළු, විවිධ සමාගම් තුළ එය 100% ක් හෝ බහුතරයක් කොටස් හිමිකාරීත්වය සඳහා, මියගිය පුද්ගලයා සතුව සහ / හෝ ඔහුගේ විදේශ වත්කම් බොහෝ පාලනය කරන කුරිල් ඇන්ස්ටල්ට් තුල (ලිච්ටෙන්ස්ටයින්හි (Lichtenstein) මත පදනම් නීතිමය ඒකකයෙහි) නීතිමය සහ / හෝ සාධාරණ අවශ්‍යතා සඳහා

කුරිල් එන්ටර්පයිසස් ලිමිටඩ්, (හොංකොං හි සංස්ථාපිත),
රෙක්ස් සමාගම, (හොංකොං),
ලෙක්ස් සමාගම, (හොංකොං),
හයිපේරියන් ආයෝජන සමාගම, (හොංකොං),
උපාලි ජාත්‍යන්තර සමාගම (හොංකොං),
උපාලි (සිංගප්පූරු) පෞද්ගලික සමාගම (සිංගප්පූරුව),
උපාලි (තායිලන්ත) සමාගම, (තායිලන්තය),
කුරිල් වෙළෙඳ පෞද්ගලික සමාගම (සිංගප්පූරුව),
උපාලි (මැලේසියාව) බර්හාඩ්, (මැලේසියාව),
කුරිල් වැවිලි බර්හාඩ්, (මැලේසියාව),
තෙනමජු ව්‍යවසාය බර්හාඩ්, (මැලේසියාව),
ගියතියයු බර්හාඩ්, (මැලේසියාව),
ග්‍රෑන්ඩ් සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට් හෝල්ඩින්ග්ස් පීඑල්සී. (එක්සත් රාජධානිය), සහ
උපාලි (ඇමරිකා එක්සත් ජනපද) සමාගම (ඇමරිකා එක්සත් ජනපදය).

නගෝල් (සිලෝන්) තේ සහ රබර් වැවිලි සමාගම, (එක්සත් රාජධානිය),
යටියන්තොට (සිලෝන්) රබර් සමාගම, (එක්සත් රාජධානිය),
ග්‍රෑන්ඩ් සෙන්ට්‍රල් (සිලෝන්) රබර් වතු සමාගම (එක්සත් රාජධානිය),
සීමාසහිත හයිලන්ඩ් ලංකා තේ සමාගම, (එක්සත් රාජධානිය),
නගෝල් හෝල්ඩිංස් ලිමිටඩ්, (එක්සත් රාජධානිය),
රිච්ක්ලන් සමාගම (එක්සත් රාජධානිය),
ග්‍රෑන්ඩ් සෙන්ට්‍රල් සමාගම (එක්සත් රාජධානිය)
ජොන්සන් සහ බාර්න්ස් සමාගම (එක්සත් රාජධානිය),
ජොන්බාර් අලෙවි සමාගම (එක්සත් රාජධානිය), සහ
ඇඩම්ස් පීක් තේ වතු සමාගම (එක්සත් රාජධානිය) හි

සෘජු සහ / හෝ වක්‍ර කොටස් හිමි මියගිය නැනැත්තකු සඳහා “

විශේෂයෙන්ම එම විදේශ රටවල ව්‍යාප්තව තිබූ ව්‍යාපාර වත්කම් පිළිබඳව කර්තෘ විසින් විමර්ශනයට ලක්කොට, ඒ මත අංග සම්පූර්ණ දත්ත ඇතුලත් කරමින් සකස් කල වාර්තාවන්, ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කරන ලද අතර, එම වාර්තාවන්ද මෙම ග්‍රන්ථයේ අඩංගු කර ඇති අතර, විශේෂයෙන්ම මෙම විෂය පිළිබඳව උනන්දුවක් දක්වන අයට සහ කැමැත්තක් දක්වන අයට ප්‍රතිලාභී වේ.

කර්තෘගේ විමර්ශනයන් මගින් මැලේසියාව, සිංගප්පූරුව, තායිලන්තය, මහා බ්‍රිතාන්‍යය සහ ඇමරිකා එක්සත් ජනපදයේ මෙහෙයුම් කටයුතු සමඟ භෞතිකව දෘශ්‍යමාන සමාගම් සහිතව, හොංකොංහි පිහිටා තිබූ කේන්ද්‍රගත

විනිවිදභාවයකින් තොර සමාගම් මාලාවක් සමඟ ඉතාමත් සංකීර්ණ සංස්ථාපිත ව්‍යුහයන් පිළිබඳ මෙම කෘතියෙන් මනාසේ ආවරණය කරනු ලබන අතර, අවසාන ‘ප්‍රතිලාභී අයිතිකරුගේ’ රහස් භාරකාරත්වය ලිච්ටෙන්ස්ටයින්හි (Lichtenstein) පරිපාලකයෙකුගේ යටතේ පවතිමින් තිබුණු බව එළිදරව් වේ.

එම පරිපාලක විසින් ඉහත කී වත්කම් වල සත්‍ය ප්‍රතිලාභ හිමියන්ගේ නම් පිළිබඳ තර්ක කර නොතිබුණු අතර, උපාලි විජේවර්ධනගේ දේපල වත්කම් වලට ඔහුගේ සහෝදරියන් දෙදෙනෙක් ඉදිරිපත් වී හිමිකම් පෑමේදී, උපාලි විජේවර්ධනගේ මරණය පිළිබඳ තහවුරුවක් ලෙස මරණ සහතිකයක් හෝ දේපල බෙදා දීම පිළිබඳ සාක්ෂි සමඟ වන උපාලි විජේවර්ධනගේ කැමැත්තක් හෝ පමණක් අවශ්‍ය බව එම පරිපාලක සඳහන් කර ඇති අතර, එම වත්කම් උපාලි විජේවර්ධනගේ විදේශ වත්කම් නොවේ යන ප්‍රශ්නය එම පරිපාලක විසින් කිසිසේත්ම නගා නැති බව සහ එම උපාලි විජේවර්ධනගේ විදේශ වත්කම්හි පරිපාලනය ඔහු විසින් සිදු කරන බව හෝ ප්‍රකාශ කර නැති බව, එළිදරව් වේ. මෙයින් මනාසේ සනාථ වන්නේ, ඔහු විසින් පාලනය කල මෙම වත්කම් සම්භාරය තර්කයක් නොමැතිව උපාලි විජේවර්ධනගේ වන අතර, එය වෙනත් අයෙකුගේ නොවන බවය.

SENATOR H.C. DR. DR.
Herbert Batliner
RECHTSANWALT

MITARBEITER:
HANS GASSNER, RECHTSAGENT
DR. IUR. PETER MONAUNI
DR. IUR. ALEX WIEDERKEHR
DR. OEC. KURT ALIG
EIDG. DIPL. BÜCHEREXPERTE
DR. IUR. ERNST WALCH, RECHTSANWALT
M.C.J., ADMITTED TO NEW YORK BAR

FL-9490 VADUZ / LIECHTENSTEIN
AEULESTRASSE 74 POSTFACH 86
TELEFON: 075 / 6 11 66
TELEX: 889 370 DRBA FL
TELEGRAMM: DORBAT VADUZ
TELEFAX: 075 / 2 43 43

Vaduz, 3rd June 1987 sn

Mr. V. Murugesu
Solicitor
att. Mr. Neelakandan
Hemas Building (3rd Floor)
York Street Colombo-1
SRI LANKA

RECEIVED
- 8 JUN 1987
MURUGESU
ATTORNEYS-AT-LAW
Ct.10(95)

Your Ref.: KN/DJWT-Ct.10(95)

Dear Mr. Neelakandan,

re: KURIL ANSTALT

We are in receipt of your registered letter dated May 25, 1987 for which we thank you very much.

Please be informed that according to contingent rules of the Liechtenstein company law particulars of the company can only be disclosed to second beneficiaries or their representatives, if the original of a death certificate issued by the competent local authorities can be produced to the Board of Directors.

In addition to that the original of the company documents, in particular Deed of Assignment (Zessionserklärung) as well as the By-Laws (Beistatut) must be presented by any persons pretending that they are entitled to the assets of the company.

Yours sincerely,

Dr.iur. Alex Wiederkehr


උපාලි විජේවර්ධන ජනාධිපති ජේ. ආර්. ජයවර්ධනගේ බෑණා කෙනෙකු වූ අතර, මැලේසියාවේ සිට ඔහුගේ පෞද්ගලික ලියජෙට් (Learjet) ගුවන් යානයකින් ශ්‍රී ලංකාවට පැමිණෙමින් සිටි අවස්ථාවක, එම ලියජෙට් (Learjet) ගුවන් යානය ඒ පිළිබඳව මහා ආන්දෝලනයක් ඇති කරමින්, 1983 පෙබරවාරි 13 දින මලයාසියාවෙන් ගුවන් ගතවූ පසු ගුවනේදී අතුරුදහන් වී තිබුණි. මේ පිලිබඳ විශේෂඥයින් පසුව කල විමර්ශනයන්හිදී එය අනතුරකට පත්ව, එම ලියජෙට් (Learjet) ගුවන් යානයේ කොටස් යැයි අනුමාන කල කැබලි හමුවූ බව මෙම ග්‍රන්ථය මගින් එම විමර්ශන වාර්තාවන්ගෙන් උපුටා දක්වමින් හෙලිදරව් කර ඇත.

කර්තෘ විසින් අනාවරණය කරන ආකාරයට, උපාලි විජේවර්ධන ශ්‍රී ලංකාවට පැමිණෙමින් සිටියේ, එසේ පැමිණි විගස මෙරට මුදල් අමාත්‍ය ධුරයට පත්වීම් ලැබීමටය. මෙය දැන සිටියේ ස්වල්ප දෙනෙකු පමණක් වන අතර, මෙම ග්‍රන්ථයේ අඩංගු වාර්තා වලින් උපාලි විජේවර්ධන මෙරටට පැමිණීමට පෙරදින රාත්‍රියේ ගත කල ආකාරය මනාසේ සවිස්තරව අනාවරණය කර ඇත.

මෙම ග්‍රන්ථයේ කරුණු සකස් කිරීමට පසුබිම වී තිබුණේ, ඒ වන විට උපාලි විජේවර්ධන ඉහත සඳහන් පරිදි අතුරුදහන් වී සිටි අතර, සහ ඔහු විවාහවී සිටියත් ඔහුට දරුවෙක් නොසිටීම හේතුවෙන්, සහ ඔහුගේ දේපළ බෙදීම සම්බන්ධයෙන් අන්තිම කැමති පත්‍රයක් ඔහු විසින් සකස් කර නොතිබීමත් මත; ඔහුගේ සොහොයුරියන් දෙදෙනා වූ හෙලේනා අනෝජා දෙවි විජේසුන්දර සහ අනුලා කල්‍යාණි දේවි ආටිගල ඉහත කී 50% අයිතිය මත, එම වත්කම්හි 50% භුක්තිය ලබා ගැනීම සඳහා අයදුම් කල අතර, අවසානයේ ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරිය දක්වා පැමිණි නඩු නිමිත්ත පසුබිම් කරගෙන වේ.

ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පවතින සාධක සැළකිල්ලට ගෙන මෙම බූදල් අර්බුදය සමථයකට පත් කිරීමට උත්සාහ දරමින්, ඒ සඳහා අවශ්‍ය වූ උපාලි විජේවර්ධනගේ වත්කම් පිළිබඳ වාර්තාවක් විමර්ශනය කොට ඉදිරිපත් කිරීම සඳහා ඔහුගේ එම බූදලය විගණනය කල විගණන සමාගමටත්, උපාලි විජේවර්ධනගේ සොහොයුරියන් දෙදෙනා වෙනුවෙන් වෘත්තීයමය උපදේශකයෙකු ලෙස කටයුතු කල කර්තෘටත් එකඟත්වයකින්

යුතුව ඒ සඳහා අවශ්‍ය බද්ධ වාර්තාව සකසා ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කරන ලෙසට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නියෝග කරන ලදී.



JOINT - REPORT

BY

MR. KINGSLEY JAYALATH, CHARTERED ACCOUNTANT
AUDITOR OF THE ESTATE OF LATE MR. P.U. WIJEWARDENE

AND

MR. NIHAL SRI AMERESEKERE, CHARTERED ACCOUNTANT
CONSULTANT TO MRS. H.A.D. WIJESUNDERA & MRS. A.K. ATTYGALLE


ON THE ACCOUNTS OF THE ESTATE OF
LATE MR. P.U. WIJEWARDENE

AS PER

SUPREME COURT ORDER DATED 17.12.1999
IN S.C. (SPECIAL) LEAVE TO APPEAL NO. 38/99

26TH APRIL 2000

ඒ අනුව, එම කර්තව්‍යයේදී උපාලි විජේවර්ධන සතුව විදේශයන්හි තිබුණේ යයි සාක්ෂි තිබූ විදේශ වත්කම් පිළිබඳ තවදුරටත් විමර්ශනය කොට, සකස් කරනු ලැබූ වාර්තා තුනක් කර්තෘ විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට අවශ්‍ය පරිදි ඉදිරිපත් කරන ලදී.



INTERIM-REPORT

I

ON

PRELIMINARY INQUIRIES AND INVESTIGATION INTO
THE FOREIGN BUSINESS INTERESTS AND/OR FOREIGN
ASSETS AND/OR FOREIGN BUSINESS TRANSACTIONS, REFERRED
TO IN THE JOINT-REPORT DATED 26.4.2000 ON THE ACCOUNTS
OF THE ESTATE OF LATE MR. P.U. WIJEWARDENE, WHICH
JOINT-REPORT HAD BEEN PREPARED AS DIRECTED BY THE
SUPREME COURT AND SUMITTED TO THE SUPREME COURT


19 OCT 2000

TRUE COPY

TRUE COPY With Annexures 'A-J'

DE SILVA & PERERA
COLOMBO - 12.

13TH SEPTEMBER 2000




INTERIM-REPORT

II

ON

PRELIMINARY INQUIRIES AND INVESTIGATIONS INTO
THE FOREIGN BUSINESS INTERESTS AND/OR FOREIGN
ASSETS AND/OR FOREIGN BUSINESS TRANSACTIONS, REFERRED
TO IN THE JOINT-REPORT DATED 26.4.2000 ON THE ACCOUNTS
OF THE ESTATE OF LATE MR. P.U. WIJEWARDENE, WHICH
JOINT-REPORT HAD BEEN PREPARED AS DIRECTED BY THE
SUPREME COURT AND SUMITTED TO THE SUPREME COURT

17TH JANUARY 2001



INTERIM-REPORT

III


ON

PRELIMINARY INQUIRIES AND INVESTIGATIONS INTO
THE FOREIGN BUSINESS INTERESTS AND/OR FOREIGN
ASSETS AND/OR FOREIGN BUSINESS TRANSACTIONS, REFERRED
TO IN THE JOINT-REPORT DATED 26.4.2000 ON THE ACCOUNTS
OF THE ESTATE OF LATE MR. P.U. WIJEWARDENE, WHICH
JOINT-REPORT HAD BEEN PREPARED AS DIRECTED BY THE
SUPREME COURT AND SUMITTED TO THE SUPREME COURT

27TH APRIL 2001

මෙම විමර්ශනයේදී සොයාගත් විශ්මජනක කරුණු සහ දත්ත මෙම ග්‍රන්ථයේ මනාසේ අඩංගු කොට ඇති අතර, සාක්ෂි ලෙස ඉහත කී සිංගප්පූරුවේ නීතිඥවරයෙකුව සිටි එංගලන්තයේ බැරිස්ටර් පදවිය දැරූ ඉෂ්වර් නහප්පන්ගේ අත්සනින් යුතුව, උපාලි විජේවර්ධනගේ මාමණ්ඩිය වූ ආචාර්ය සීවලී රත්වත්ත විසින් ඔහුගේ සමීප ව්‍යාපාර හවුල්කරුවකු වූ ආර්.

මුරුගයියාගේ සමඟ එක්ව එම විදේශයේ තිබූ දේපල වලින් සමහරක් විකිණීම පිළිබඳ ගිවිසුමක් අත්සන් කර විකිණීමට කටයුතු කර ඇති බව කර්තෘගේ මෙම කෘතියෙහි සඳහන් දත්ත සහ තොරතුරු මගින් මනාව හෙළිදරව් වේ. මෙම සමහර කරුණු නිවැරදි සහ සත්‍ය සාක්ෂි සහිතව පහත දක්වා ඇති එම ගිවිසුමේ පහත සඳහන් අත්සන් සහිත කොටසින් හෙළිදරව් වේ.



10. General

(a) The Company has not delegated any powers under a power of attorney which remains in effect nor has it given any other authority (express implied or ostensible) which is still outstanding or effective to any person to enter into any contract or commitment or do anything on its behalf.

(b) So far as the Vendor is aware neither this Agreement not Completion will or is likely to cause the Company to lose the benefit of any right or privilege it presently enjoys.

KURIL ENTERPRISES LIMITED

By ..............................

Name Dr. S.H. RATNATTE

Title Attorney for Kuril Enterprises Ltd.

R. MURUGIAH
ATTORNEY
KURIL ENTERPRISES LTD

Signed in the presence of James Eardley Seneviratne
Attorney-at-law

PEACOCK (LONDON) LIMITED

By ..............................

Name Ishwar Nahappan


Title Director

Signed in the presence of:-
S.J. [illegible]
25-02 Ocean Building
10 Collyer Quay
S'pore 0104
English Solicitor

උපාලි විජේවර්ධන අතුරුදහන් වූයේ 1983 පෙබරවාරි 13 වන දිනය. ඔහුගේ ඇටෝර්නි බලපත්‍රය ඔහුගේ විශ්වාසවන්ත සමීපතම ව්‍යාපාරික සගයා වූ ආර්. මුරුගයියා වෙත පවරා තිබුණි.

මෙම අවාසනාවන්ත ලියජෙට් (Learjet) ගුවන් යානය පිළිබඳ සිදුවීම වූ විගසම, ආර්. මුරුගයියාට එකී ඇටෝර්නි බලපත්‍රයේ බලය යොදා ගෙන ක්‍රියාකිරීමට ප්‍රශ්ණකාරීව එහි බලය රහිත වුවත්, ආර්. මුරුගයියා විසින් උපාලි විජේවර්ධනගේ බිරිද වන ලක්මිණී විජේවර්ධනගේ නමට එම ආදේශිත ඇටෝර්නි බලය ඔහු විසින් පවරන ලදී.

පසුව, ලක්මිණී විජේවර්ධන විසින් ඇයට පැවරූ ඉහත කී ආදේශිත ඇටෝර්නි බලපත්‍රයේ බලය යොදා ගනිමින්, උපාලි විජේවර්ධනගේ ඉහත සඳහන් කල අතුරුදහන් වීමත් සමගම, ඔහුගේ දේපල සමහරක් විකිණීමට සහ / හෝ පැවරීමට එය උපයෝගී කරගෙන ඇත. මෙසේද ක්‍රියාකර ඇත්තේ, උපාලි විජේවර්ධනගේ බූදල් ප්‍රකාශයේ 1983 පෙබරවාරි 13 දින සිට ඔහු පිළිබඳ කිසිම තොරතුරක් හෝ සංවාදයක් හෝ ඔහු පිළිබඳ ඇසූ කෙනෙකු හෝ ඔහුව දුටු කෙනෙක් පිළිබඳව අනාවරණය වීමක් නොතිබූ බවට ප්‍රකාශයක් සිදු කිරීමෙන් අනතුරුවය - එනම්:



Form No. : ED 1

Estate Duty File No. ..................

Please quote this number in every communication relating to this declaration.

බුදල් බද්ද—ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

ESTATE DUTY—DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA

Declaration of Property required under Section 24 of the Estate Duty Act No. 13 of 1980.

| | |
|---|---|
| Full Name of the Deceased | PHILIP UPALI WIJEWARDENE |
| Date and Place of Death | On or about 13th February 1983 |
| Age and Occupation | 45 years. Company Director |
| Domicile | Sri Lanka |
| | No. - Intestate |
| | Messrs. Julius & Creasy, P.O. Box 154, Colombo |

I, LAKMANI RATWATTE WIJEWARDENE declare that to the best of my knowledge information and belief the statements contained in this form and in the schedules attached hereto are true and correct an that I have disclosed all the property liable to estate duty on the death of the deceased and have made a true and correct estimate of the value of such property.

Dated this 28 day of April 19..

Signature of Declarant.

තවද, මෙයින් පැන නගින ප්‍රශ්නයක් වන්නේ, යමෙකුගේ ඇටෝර්නි බලයක් යොදා ගනු ලබන්නේ යම් පුද්ගලයෙක් විදේශගතව සිටින අවස්ථාවක, ඔහුගේ දැනුම ඇතිව, අවශ්‍ය ලේඛනයකට ඔහු වෙනුවෙන් අත්සන් තැබීමටය. එබැවින් එසේ දැනුම් දීමකින් තොරව, යමෙකුගේ ඇටෝර්නි බලය යොදා ගැනීමට හැකියාවක්, විශේෂයෙන්ම එම ආදේශිත ඇටෝර්නි බලය හිමි අයෙකුට ඕනෑම පරමාර්ථයකින් එම ඇටෝර්නි බලපත්‍රය භාවිතා කල හැකිද, වත්කම් පැවරීමට හෝ ඒ මත ලාභදායකයෙකු වීමට ක්‍රියා කිරීම සඳහා භාවිතා කල හැකිද යන්න සහ විශේෂිතව, එහි වලංගුභාවය සහ එවැනි කරුණක නීතිමය තත්වය නීති ක්ෂේත්‍රයේ සැළකීමට තුඩු දෙන මාතෘකාවක් වන්නේය.

කෙසේ වෙතත්, ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නිගමනය වුයේ, පවතින නීතියට අනුව උපාලි විජේවර්ධන මිය ගොස් ඇතැයි සලකනු ලබන්නේ, එසේ අතුරුදහන් වූ දින සිට එනම් 1983.2.13 දින සිට *වර්ෂයක් ගෙවී ගිය* පසුව, එනම් 1984 පෙබරවාරි 13 දින සිට බවය.

ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණය එසේ නිගමනය කලේ, අගවිනිසුරු සරත් එන්. සිල්වා ඇතුළු, විනිසුරු නිහාල් ජයසිංග එකඟවීමෙන් සහ ශිරාණි ඒ. බන්ඩාරනායක විනිසුරුවරිය එම නිගමනයට වෙනම විරුද්ධ තීන්දුවක් ලබා දීමෙන්, උපාලි විජේවර්ධන ඇතුළු අනෙක් පස් දෙනා ගමන් කල උපාලි විජේවර්ධනගේ පෞද්ගලික ලියජෙට් (Learjet) ගුවන් යානය අතුරුදහන් වීම පිළිබඳ ඉහත සඳහන් කළ විශේෂඥයින්ගේ විමර්ශන වලින් එළිදරව් වූ කරුණු කාරණා සහිත වාර්තා සැලකිල්ලට නොගැනීමෙන්ද යන මතයක් පැන නැඟී ඇත.

තියුණු ලෙස, ඒ අතරතුරම ගම්පහ දිසා අධිකරණය විසින් ලබා දුන් තීන්දුව මගින් එම ගුවන් යානයේ සිටි ආනන්ද සරත් පෙලිමුහන්දිරම් නැමැත්තා 1983 පෙබරවාරි 13 දින එම ලියජෙට් (Learjet) ගුවන් යානා අනතුරින් මියගිය බවට සනාථ කර, ඒ අනුව මරණ සහතිකය ලබා දී ඇති බවට තීරණය කර ඇත. මේ අනුව පෙනී යන එක් කරුණක් නම්, ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඉහත බහුතරයක තීරණය එම ලියජෙට් (Learjet) ගුවන් යානාවේ සිටි පුද්ගලයින් 5 දෙනාගෙන් එක් පුද්ගලයෙකු සම්බන්ධයෙන් ගම්පහ දිසා අධිකරණය විසින් ඉදිරිපත් කරන ඉහත කී නිගමනයන් එකිනෙකට පරස්පර විරෝධයක් ඇති බව වන අතර, ඒ බව මෙම ග්‍රන්ථයෙන් මනාසේ එළිදරව් කර ඇත. !

එසේම තවත් ප්‍රශ්නකාරී කරුණක් වන්නේ, එකම ගුවන් යානයක ගමන් ගත් පුද්ගලයින් දෙදෙනෙකු, එම ගුවන් යානය අනතුරකට ලක්වී එකම දින අතුරුදහන් වීමෙන් පසු, එය ශ්‍රී ලංකා අධිකරණ මගින් විමර්ශන කිරීමෙන් පසුව එකම දින මිය ගිය ලෙස නොව, වසරක වෙනසක් සහිතව, මරණ දිනයන් දෙකක් ලෙස නිගමනය කිරීම විශ්මජනක සහ හාස්‍යජනක වීමය.

උපාලි විජේවර්ධනගේ බූදල් විගණන වාර්තා වල සනාථ වී තිබූ පරිදි, ඔහු 1983 පෙබරවාරි 13 දින මියගිය බවත්, ඉන්පසුව ඔහුගේ ගිණුම් වාර්තා නැසීගිය උපාලි විජේවර්ධනගේ බූදල් වාර්තා ලෙස විගණනය කර සහතික කොට තිබී ඇති බවත් සඳහන්ය. ඉහත කී පසුබිම මත 1983 පෙබරවාරි 13 දින සිට 1984 පෙබරවාරි 13 දින දක්වා වර්ෂය තුල උපාලි විජේවර්ධනගේ දේපල පැවරීමට සහ අත්පත් කර ගැනීමට ආදේශිත ඇටෝර්නි බලපත්‍රය භාවිතා කිරීම උපාලි විජේවර්ධනගේ කිසිම අනුදැනුමකින් තොරව, එමගින් ඔහුගේ දේපල සහ ධනය පවරා ගැනීමේ එවැනි ගනුදෙනුවල වලංගුභාවය උඩු යටිකුරු කිරීම පිළිබඳ මෙම ග්‍රන්ථයෙන් පෙන්නුම් කර ඇත - එනම්:

KINGSLEY JAYALATH

**KINGSLEY JAYALATH & CO.**
Chartered Accountants

21 July 1997

Mrs L R Wijewardene
The Administratrix of the
Estate of Late Mr P U Wijewardene
38 Thurstan Road
Colombo 3

Dear Madam,

**Audit Report of the Estate of Late Mr P U Wijewardene**
**Period covered : 13 February 1983 - 31 March 1996**

We have pleasure in forwarding herewith the audited accounts of the Estate of Late Mr P U Wijewardene for the financial years 1983/84 to 1995/96. We wish to report as follows:

- **Assets & Liabilities**

  We have considered as correct the values accepted by the Department of Inland Revenue for estate duty purposes of the assets and liabilities on the date of disappearance of Mr P U Wijewardene.

- **Power of Attorney**

  We have accepted the power - of - attorney given by Mr P U Wijewardene to Mr Ramalingam Murugiah and of the substitute (Mrs Lakmani Ratwatte Wijewardene) of Mr Ramalingam Murugiah.

- **Direct Confirmations**

  We have not received direct confirmation of bank balances at the end of the financial years. Further, direct confirmations of balances from debtors and creditors too have not been received.

*K. N. JAYALATH. F. C. A.*
*43/3 SRI-SARANANKARA ROAD, DEHIWELA.* *T. P. 716900*

KINGSLEY JAYALATH

**KINGSLEY JAYALATH & CO.**
Chartered Accountants

- **Payment of Taxes**

  During the period under consideration Rs.11,930,452, Rs.1,346,231 and Rs. 1,401,0[illegible] were paid as income tax and wealth tax, capital levy tax, and estate duty respectively.

  All tax payments have been finalised upto Y/A 1988/89.

We shall be pleased to submit any other information that you may require in this regard.


Yours sincerely,

KINGSLEY JAYALATH & CO.
Chartered Accountants


*K. N. JAYALATH. F. C. A.*
*43/3 SRI-SARANANKARA ROAD, DEHIWELA.* *T. P. 716900*

ඉහත කී වාර්තා වලින් එළිදරව් වූ ආකාරයට උපාලි විජේවර්ධනය අයත්ව තිබූ විදේශ වත්කම් නොයෙකුත් රටවල පැතිර තිබූ අතර, එකී ව්‍යාපාර කටයුතු කල සමාගම්, ඒවායේ අයිතිය නාමික වශයෙන් ලියාපදිංචි කර තිබූ සමාගම් සහ අවසානයේ ලිච්ටෙන්ස්ටයින් (Lichtenstein) පරිපාලක උපාලි විජේවර්ධනගේ විදේශ වත්කම් වල භාරකත්වය තහවුරු කල අන්දම විමර්ශන වාර්තාවල අඩංගු කර ඇති පහත සඳහන් ප්‍රස්ථාර වලින් එළිදරව් වේ.

CHART - DEPICTING THE COPORATE STRUCTURAL RELATIONSHIPS



**THE RESULTANT POSITION AFTER THE SALES OF THE SHAREHOLDING OF THE FOREIGN COMPANIES (THOSE SOLD DEPICTED SHADED), REFERRED TO IN THE JOINT-REPORT DATED 26.4.2000, AFTER THE DEATH OF LATE MR. P.U. WIJEWARDNE ON 13.2.1983**



ඉහත කී උපාලි විජේවර්ධනගේ විදේශ ගනුදෙනු පිළිබද විනිමය පාලක විසින් විශේෂ පුළුල් විමර්ශනයක් සිදු කරගෙන යන අතරතුර, ඔහුගේ මාමාණ්ඩිය වූ ආචාර්ය සීවලී රත්වත්ත මිය ගියේය. එයින් පසු එම විනිමය පාලක පරීක්ෂණයට අත් වූ ඉරණම කුමක්දැයි තවමත් අභිරහසක්ව පැවතීම, ඉහල සමාජයේ දේශපාලන සහ සමාජීය යථාර්ථය පිළිඹිබු කිරීමකි.

<u>එක්සත් රාජධානි පවුම් (ආසන්න වශයෙන්.)</u>

**ග්‍රෑන්ඩ් සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට් හෝල්ඩින්ග්ස් පීඑල්සී., එක්සත් රාජධානිය**
**හි කොටස්හිමිකාරීත්වය 74.37% ක් අලෙවිය– *(1985)***
**1,936,743**

**උපාලි (මැලේසියාව) බර්හාඩ්, මැලේසියාව, හි**
**කොටස්හිමිකාරීත්වය 100 % ක් අලෙවිය**
**(ග්‍රෑන්ඩ් සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට් හෝල්ඩින්ග්ස් පීඑල්සී.,**
**එක්සත් රාජධානිය හි උපලබ්ධිත– *1986)***
**570,000**

**කිරුල් වතු සමාගම, බර්හාඩ්, මැලේසියාව, හි**

| | | | |
|---|---|---|---|
| **කොටස් හිමිකාරිත්වය 100 % ක් අලෙවිය** | **– *(1987)*** | **3,567,000** | |
| | **–*(1990)*** | **<u>2,266,000</u>** | **5,833,000** |

**උපාගි තායිලන්ත සමාගමෙහි කොටස්හිමිකාරීත්වය**
**(?) අලෙවිය – *(1985 ?)***
**393,000**

**<u>ඩේසා කොටස් හිමිකාරීත්වය 50 % ක් අලෙවිය</u>**

| | |
|---|---|
| **උපාලි, මැලේසියාව – *(1985 ?)*** | **<u>1,033,000</u>** |
| **සමස්ථ එක්සත් රාජධානි පවුම්** | **<u>9,765,743</u>** |

පුදුමාකාර ලෙස මෙම ඉහත සඳහන් කල සමාගම් වල අධ්‍යක්ෂකවරුන් නීති හවුල් සමාගම් වල හවුල්කරුවන් වීම කැපී පෙනෙන විශේෂ ලක්ෂණයක් වන අතර, මෙම විෂය පිළිබද ප්‍රායෝගික දැනුමක් ලබා ගැනීමට කර්තෘ මහා බ්‍රිතාන්‍යයේ චැනල් අයිලන්ඩ්හි පිහිටි ජර්සි දූපතට ගොස්, මෙවැනි සමාගම් වරලත් ගණකාධිකාරීවරුන්ගේ සහ නීතිඥවරුන්ගේ සමාගම් එකතුවී හවුලේ ඇතිකරගත් ක්‍රමවේදයන්, සහ නාමික කොටස්කරුවන් සහ අධ්‍යක්ෂකවරුන් එම සමාගම් වලට පත් කිරීමත්, 'සැබෑ අයිතිකරු' සමග මේ කොටස්කරුවන් භාරකාරත්වයේ ගිවිසුමක් රහසිගතව ඇතිකර ගෙන, ගෝලීය වශයෙන් මහා බ්‍රිතාන්‍යයේ චැනල් අයිලන්ඩ්හි පිහිටි ජර්සි දූපතේ ක්‍රියාකාරකම් මෙන්, උපාය මාර්ගයන් ස්ථාපනය කර සහ එවැනි මුදල් සගවා තැබීමේ ක්‍රමවේදයන් අභ්‍යාස කරමින් ලෝකයේ වෙනත් විදේශ රටවල් ගණනාවකද සැබෑ හිමිකරුවන්ගේ මුදල් සඟවා තැබීම සිදු කර ඇති බව නිගමනය වේ.

නූතන ලෝකයේ ඉහත කී කාරණය පිළිකාවක් සේ ඉස්මතු වී, සංවර්ධිත රටවල ගෝලීය ප්‍රශ්නයක් බවට පත්ව ඇත. එමඟින් සංවර්ධිත රටවල් වල පුරවැසියන් වෙනත් රටවල එසේ මුදල් සම්භාරයක් සඟවා ගෙන තිබීම සහ එමගින් ඔවුන්ගේ පුරවැසියන්ගෙන් නිවැරදි ලෙස බදු එකතු කිරීමේදී ගැටලු නිර්මාණය වී තිබීම එම රටවල් වලට ප්‍රශ්නයකි.

කෙසේ වෙතත්, ඊටත් වඩා, දූගී දුප්පත් රටවල දේශපාලනීය සහ සමාජීය බලය අයුතු ලෙස යොදා ගනිමින්, එම දූගී දුප්පත් ජනතාවගේ මහජන දේපල කොල්ලකා, මාකොල්ල කා මේ ආකාරයට විදේශයන්හි සඟවා තිබීම එවැනි දූගී සංවර්ධනය වෙමින් පවතින රටවල පවතින ප්‍රධාන ගැටලුවකි.

එමනිසා සංවර්ධිත සහ සංවර්ධනය වෙමින් පවතින රටවල් නූතන ලෝකයේ විදේශ රටවල මෙසේ සංස්ථාපිත ව්‍යුහයන් තුල සඟවා ඇති මුදල් සොයා ගැනීමට ජාත්‍යාන්තර වශයෙන් විමර්ශනයන් සිදු කිරීමට දැවැන්ත ප්‍රයත්නයන් දරයි.

මහජනයාගේ සම්පත් මංකොල්ල කමින්, තවදුරටත් ඔවුන් දිළිඳු භාවයට පත් කළ විවිධ දුප්පත් සංවර්ධනය වෙමින් පවතින රටවල් වල දේශපාලනික නායකයින්, බලවතුන් සහ ධනවතුන්, විශේෂයෙන්ම දියුණු රටවල ඉහත කී ආකාරයට රහසේ ධනය රැස්කරමින් සඟවා තිබීමෙන්, එම දියුණු රටවල් එම සම්පත් වලින් තව තවත් ලාභ උපායා ගැනීමට අවස්ථාව උදාකර ගැනීමත්, එමගින් මංකොල්ල කා සංවර්ධනය වෙමින් පවතින රටට සහ එම රටේ පොදු මහජනතාවට විඳීමට හේතු වන අසාධාරණ හානිය සහ කරදර මෙයින් හෙළිදරව් වේ.

කර්තෘ විසින් අන්‍යෝන්‍ය වශයෙන් නීතිය බලාත්මක කිරිම පිළිබඳ ආදර්ශනය කරමින් අවධානය යොමු කරමින්, දේශපාලනික බලවතුන්ගේ හැසිරීම හේතුවෙන්, නීතිමය අර්ථ නිරූපණයන් සහ නීතිය ඉදිරියේ අසමාන සැලකිලි අවස්ථා පිළිබඳ අවධානය යොමු කර ඇත. තවද කර්තෘ විසින් මියගිය තැනැත්තෙකුගේ දේපල විමර්ශනයට ලක්කොට ඒ සම්බන්ධිත අධිකරණ කටයුතු පිළිබඳ මනා අවබෝධයක් මෙම ග්‍රන්ථයෙන් ලබා දී ඇත.